# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2264/53 – 2022 ජනවාරි 27 වැනි බ්‍රහස්පතින්දා– 2022.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

1992 ජූලි 31 දින අංක 725/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1992 අංක 105 දරන ආඥාවේ සහ එම ආඥාවට සංශෝධනයක් කරමින් 1992 දෙසැම්බර් 30 වැන දින අංක 747/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1992 අංක 105 දරන ආඥාවේ ශුද්ධි පත්‍රිකාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, එකී ඉඩම් කොටස් අතරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 3J/91/LRB/270.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: BER/4/5/3/8.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**1 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය අදායම් නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ගමේ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පිහිටි බලයලත් මිනින්දෝරු බී.එච්.ඒ.ද සිල්වා මහතා විසින් පිළියෙළ කරන ලද අංක 91/11/10 හා 1991.10.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 11 – මාගල්ල වෙල, – ප්‍රමාණය: හෙක්. 0.186**

උතුරට: කැබලි අංක 10; නැගෙනහිරට: එන්. වී. ජයසේන සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; දකුණට: කිරින්තිය පාර; බටහිරට: කැබලි අංක 08.

01 – 0293

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.